# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 9 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය කාලය :පැය 2

### I පත්‍රය

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරන්න.**

(1) සැදැහැතියන් විසින් දැක පහන් සංවේග උපදවාගත යුතු ස්ථාන හතරක් බුදුරදුන් දේශනා කළ සේක. ඒවානම් බුදුරදුන් උපන්තැන, සම්බුද්ධත්වය පත් වූ තැන, දම්සක් දෙසූ තැන හා,

i) සරණ මංගල්‍යය සිදු වූ තැන
ii) සතර පෙර නිමිති දුටු තැන
iii) අභිනිෂ්ක්‍රමණය කළ තැන
iv) පිරිනිවන් පෑ ස්ථානය

(2) බුදු සසුනේ අවසන් බුද්ධ ශ්‍රාවකයා,

i) සුභද්‍ර තෙරුන්ය.
ii) ආනන්ද තෙරුන්ය.
iii) ධම්මරාම තෙරුන්ය.
iv) මහා කාශ්‍යප තෙරුන්ය.

(3) නන්ද හිමිට නැවත ශාසන ඇල්ම ඇති කිරීම, ඛේමාවට රූපයේ අනිත්‍ය පසක් කරදීම. චුල්ලපන්ථක තෙරුන් රහත් මහට යොමු කිරීම, කිසා ගෝතමියට මරණය උරුමයක් බව පසක් කිරීම තුළින් පැහැදිලි වන බුදු සිරිතේ විශිෂ්ට ලක්ෂණය වන්නේ,

i) ආදර්ශවත් බව
ii) සමානාත්මතාවය
iii) අකම්පිත බව
iv) ස්ථානෝචිත ප්‍රඥාව

(4) කාමසුඛල්ලිකානුයෝගය, අත්තකිලමතානුයෝගය යන අන්තවලින් මිදී මධ්‍යම ප්‍රතිපදාව අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ භික්ෂු ප්‍රතිපදාව පුරන බැවින් මහා සංඝරත්නය,

i) සුපටිපන්න නම් වන සේක.
ii) උජුපටිපන්න නම් වන සේක.
iii) ඤායපටිපන්න නම් වන සේක.
iv) සාමීචිපටිපන්න නම් වන සේක.

(5) මෙලොව පරලොව සැපත පිණිස පිළිගන්වනු ලබන සියලු දාන පිළි ගැනීමට සුදුසු වන හෙයින්, මහා සඟරුවන,

i) ආහුනෙය්‍ය නම් වේ.
ii) පාහුනෙය්‍ය නම් වේ.
iii) දක්ඛිනෙය්‍ය නම් වේ.
iv) අඤ්ජලිකරණීය නම් වේ.

(6) බුදුරදුන්ගේ ලලාට ධාතුව නිධන් කොට ඇත්තේ,

i) මිරිසවැටිය චෛත්‍යයේය.
ii) තිස්සමහාරාම චෛත්‍යයේය.
iii) ථූපාරාම චෛත්‍යයේය.
iv) මිහින්තලය චෛත්‍යයේය.

(7) අනුරාධපුර මහමෙව්නා උයනේ පිහිටි ශ්‍රී මහා බෝධීන් වහන්සේ,

i) ශාරීරික චෛත්‍යයකි
ii) පාරිභෝගික චෛත්‍යයකි
iii) උද්දේසික චෛත්‍යයකි
iv) තුන්තරා බෝධියකි

(8) සිදුහත් කුමරු වප් මඟුල් උළලේ දී දඹ රුක් සෙවණේ සිට වඩනු ලැබූ භාවනාව වන්නේ,

i) ආනාපානසති භාවනාවයි
ii) බුද්ධානුස්සති භාවනාවයි
iii) මෛත්‍රී භාවනාවයි
iv) පිළිකුල් භාවනාවයි

(9) චිර රාත්‍රඥ (ශාසනයේ දීර්ඝ කාලීන අත්දැකීම් ඇති) භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත් වූයේ,

i) යශෝධරා තෙරණියයි
ii) ඛේමා තෙරණියයි
iii) මහා ප්‍රජාපතී තෙරණියයි
iv) උත්පලවන්නා තෙරණියයි

(10) බුදුරජාණන් වහන්සේ විසින් යශෝධරාව පති භක්තියෙන් යුතුව දිවි ගෙවූ බව හැඟවීම සඳහා දේශනා කළ ජාතකය වනුයේ,

i) ලෝමහංස ජාතකයයි
ii) තේමිය ජාතකයයි
iii) වට්ටක ජාතකයයි
iv) චන්ද කින්නර ජාතකයයි

(11) තම පව් කළොත් එයින් තමාම අපිරිසිදු වේ. පින් කළොත් එයින් තමාම පිරිසිදු වේ. පිරිසිදු බව හා අපිරිසිදු බව තමා කරන ක්‍රියාව අනුව තීරණය වේ. වෙනත් කෙනෙකුට තවත් කෙනෙකු පිරිසිදු කළ නොහැකිය යන අදහස ඇතුළත් ධම්මපද ගාථාව වනුයේ,

i) "අත්තනාව නකං පාපං....."
ii) "සුකරානි අසාධූනි......"
iii) "නතං කම්මං කතං සාධු......"
iv) "තංච කම්මං කතං සාධු......"

(12) චතු අප්පමඤ්ඤා යනු,

i) සතර සංග්‍රහ වස්තු
ii) සතර බ්‍රහ්ම විහරණ
iii) සතර අගතියයි
iv) චතුරාර්ය සත්‍යයි

(13) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සලකා සතුටට පත් වන ස්වභාවය,

i) මෙත්තා නමිනි
ii) කරුණා නමිනි
iii) මුදිතා නමිනි
iv) උපේක්ෂා නමිනි

(14) තමා පව් නොකිරීම, අනුන් ලවා පව් නොකරවීම, අනුන් පව් කරන විට අනුමත නොකිරීම යන කරුණු ඇතුළත් වන්නේ,

i) ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලයට ය
ii) පංචශීලයට ය
iii) දස ශීලයට ය
iv) ආජීව අෂ්ටමක ශීලයට ය

(15) පාපයට ඇති ලැජ්ජාව හා බිය හැඳින්වෙන්නේ,

i) ශිලය ලෙසිනි
ii) චාරිත්‍ර ලෙසිනි
iii) වාරිත්‍ර ලෙසිනි
iv) හිරි හා ඔත්තප්ප ලෙසිනි

(16) සිඟාලෝවාද සූත්‍රයේ ඇතුළත් යුතුකම් අතරින් යුතුකම් 6ක් ඉටු කළ යුත්තේ කිනම් සමාජ සංස්ථාවද?

i) ස්වාමිය - සේවකයාට
ii) සේවකයා - ස්වාමියාට
iii) ගිහියා - පැවිදි පක්ෂට
iv) පැවිදි පක්ෂය - ගිහියාට

(17) 'ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදානය' හෙවත් 'සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය' නැමැති ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

i) පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමි විසිනි.
ii) පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි විසිනි.
iii) පූජ්‍ය වැලිවිට සරණංකර හිමි විසිනි.
iv) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි විසිනි.

(18) අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීම මංගල කරුණක් බව දැක්වෙන මංගල සූත්‍ර පාඨයේ මුල් පදය වනුයේ,

i) "බාහු සච්චංච සිප්පංච....."
ii) "අසේවනාච බාලානං....."
iii) "ඵුට්ඨස්ස ලෝක ධම්මේහි....."
iv) "ලාභෝ අලාභෝ අයසෝ යසෝච....."

(19) බුදුරජාණන් වහන්සේ විසින් අගය කරනු ලබන්නේ අඩු බලාපොරොත්තු ඇති සීමිත ආශාවන් ඇති ජීවිතයි. බලාපොරොත්තු අඩු තැනැත්තා ලද දෙයින් සතුටු වෙයි. එම ගුණය හැඳින්වෙන්නේ,

i) සන්තුස්සකෝ ලෙසිනි
ii) සුභරෝ ලෙසිනි
iii) අප්පකිච්චෝ ලෙසිනි
iv) සන්තින්ද්‍රියෝ ලෙසිනි

(20) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ශීල ශික්ෂාවට අයත් මාර්ගාංගයක් වන්නේ,

i) සම්මා දිට්ඨි
ii) සම්මා වායාම
iii) සම්මා ආජීව
iv) සම්මා සමාධි

$(2 \times 20 = 40)$

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන මුළු ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

1) දෙවන වාරය සඳහා ඔබ විසින් සිදු කරන ලද පාසල් පාදක ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i) ඔබ විසින් සිදු කළ ඇගයීම කුමක්ද?

   ii) ඒ සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් 02ක් ලියන්න.

   iii) ඔබ ගමේ නායක මාහිමියන් වැඩ සිටින විහාරස්ථානයේ නම ලියන්න.

   iv) ඔබ ගමේ විහාරාධිපති හිමියන්ගේ නම කුමක්ද?

   v) ඔබ පන්සලේ නායක මාහිමිගෙන් ගමට ඉටුවන සේවාවන් 02ක් ලියන්න.

   vi) අතිපූජ්‍ය බලංගොඩ මහානාහිමියන්ගේ ගිහිකළ නම කුමක්ද?

   vii) උන්වහන්සේ විසින් ආරම්භ කළ පුවත්පතක් නම් කරන්න.

   viii) පූජ්‍ය බලංගොඩ මහානාහිමියන්ට ලැබුණු ගෞරව නාමයන් 02ක් ලියන්න.

   ix) උන් වහන්සේ තුළ පැවති උතුම් ගුණාංග 02ක් ලියන්න.

   x) උන් වහන්සේ ඉටු කළ ශාසනික සේවාවන් 02ක් ලියන්න.

$(2 \times 10 = 20)$

2)

   i) අවසන් බුද්ධ වචනය සිංහලෙන් ලියන්න.

   ii) බුදු සිරිතෙහි විශිෂ්ඨ චරිත ලක්ෂණ තුනක් ලියන්න.

   iii) ඉන් එකක් විස්තර කරන්න.

$(2 + 3 + 5 = 10)$

3)

   i) සසගුණ දෙකක් නම් කරන්න.

   ii) සොළොස්මස්ථානයට අයත් පූජනීය ස්ථාන තුනක් නම් කරන්න.

   iii) වන්දනා ගමන් වලදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පිළිබඳ විස්තරයක් කරන්න.

$(2 + 3 + 5 = 10)$

4)

   i) ආනාපානසති භාවනාවේදී ගැහැණු දරුවන් හා පිරිමි දරුවන් වාඩි විය යුතු ආකාරය දක්වන්න.

   ii) ප්‍රජාපතී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.

   iii) භද්දකච්චායනා තෙරණිය පිළිබඳ විස්තරයක් කරන්න.

$(2 + 3 + 5 = 10)$

5)

   i) සේව්‍යයා විසින් සේවකයාට ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න.

   ii) ගිහියා විසින් පැවිදි පක්ෂයට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.

   iii) සේවකයා විසින් සේව්‍යයාට ඉටු කළ යුතු යුතුකම් පහක් ලියන්න.

$(2 + 3 + 5 = 10)$

6)

i) අටලෝ දහමට අයත් කරුණු දෙකක් ලියන්න.

ii) ඉන් එකක් පැහැදිලි කරන්න.

iii) ලාංකීය ජන සමාජයේ සාමය හා සහජීවනය ඇතිවීම සඳහා වැවයි - දාගැබයි - ගමයි - පන්සලයි අතර සම්බන්ධය පැහැදිලි කරන්න.

$(2 + 3 + 5 = 10)$

7) පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

i) නිවන

ii) සම්මා වාචා

iii) කරුණා ගුණය

iv) අෂ්ඨ ගරු ධර්ම

$(5 \times 2 = 10)$